# ව්‍යවස්ථා හා විෂය නිර්දේශ

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55 (1) හා (ඉ) සහ (55) 2 වගන්ති යටතේ සාමාන්‍ය (සර්වාංග) හා විශේෂ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

## ආයුර්වේද වෛද්‍ය සභාව

# ව්‍යවස්ථා හා විෂය නිර්දේශ

## I කොටස

01. සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම :

පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්, පනතේ 55(1) (අ) සහ (ඉ) වගන්ති යටතේ සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනු ලැබේ.

1.1 වයස අවුරුදු 23 සම්පූර්ණවීමෙන් පසුව යටත් පිරිසෙයින් දස අවුරුද්දක් ගුරුවරයා යටතේ සාමාන්‍ය (සර්වාංග) වෛද්‍ය වෘත්තියෙහි කර්මාභ්‍යාසය ලබා වයස අවුරුදු 45 සම්පූර්න වී ඇති අයෙකු වීම, නැතහොත්

1.2 වයස අවුරුදු 23 සම්පූර්ණවීමෙන් පසුව යටත් පිරිසෙයින් පස් අවුරුද්දක් ගුරුවරයා යටතේ සාමාන්‍ය (සර්වාංග) වෛද්‍ය වෘත්තීයෙහි කර්මාභ්‍යාසය ලබා ඇති අයෙකු වීම.

සටහන :

(i). ඉහත 1.1 වගන්තියේ දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට පෙර, ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ii). ඉහත 1.2 වගන්තියේ දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට පෙර, ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන ලිඛිත හා වාචික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

02. විශේෂ වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම :

පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් (55) 2 වගන්ති යටතේ විශේෂ වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනු ලැබේ.

2.1 වයස අවුරුදු 21 සම්පූර්ණවීමෙන් පසුව යටත් පිරිසෙයින් අවුරුදු හතක් ගුරුවරයා යටතේ අදාළ විශේෂ අංශය පිළිබඳ වෛද්‍ය වෘත්තියෙහි කර්මාභ්‍යාසය ලබා වයස අවුරුදු 45 සම්පූර්න වී ඇති අයෙකු වීම.

2.2 නැතහොත් වයස අවුරුදු 21 සම්පූර්ණවීමෙන් පසුව යටත් පිරිසෙයින් අවුරුදු හතරක් ගුරුවරයා යටතේ අදාළ විශේෂ අංශය පිළිබඳ වෛද්‍ය වෘත්තීයෙහි කර්මාභ්‍යාසය ලබා ඇති අයෙකු වීම.

සටහන :

(i). පහත දැක්වෙන විශේෂ අංශ සඳහා ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද වෛද්‍ය සභාවේ විශේෂ නාම ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබේ.

(අ) සර්ප විෂ වෙදකම, (ආ) ජලභීතිකා වෙදකම, (ඇ) කැඩුම් බිඳුම් වෙදකම, (ඈ)ගෙඩිවණ වෙදකම, (ඉ) දැවුම්පිළිස්සුම් වෙදකම, (ඊ) විදුම් පිළිස්සුම් වෙදකම, (උ) ඇස් වෙදකම, (ඌ) මානසික රෝග වෙදකම, (එ) චර්ම රෝග වෙදකම

(ii). ඉහත සඳහන් 2.1 වගන්ති යටතේ දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට පෙර, ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(iii). ඉහත 2.2 වගන්ති යටතේ දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමට පෙර, ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන ලිඛිත හා වාචික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

DO NOT COPY

03. ලියාපදිංචි වීම සඳහා අයදුම් කිරීම :

3.1 පනතේ 55(1) (අ) සහ (ඉ) වගන්ති යටතේ සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට නියමිත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්, සහ පනතේ 55 (2) වගන්තිය යටතේ විශේෂ වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීමට නියමිත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් ද, ආයුර්වේද වෛද්‍ය සභාව විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සභා 1 දරණ මුද්‍රිත අයදුම්පත්‍රයක් හා ඒ සමග නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි වෙත එවිය යුතු යි.

04. නියමිත සුදුසුකම් ඇති බව සනාථ කිරීම :

4.1 සෑම අයදුම්පතක් සමඟම රෙජිස්ටාර් ජනරාල් කාර්යාලයෙන් හෝ දිස්ත්‍රික් රෙජිස්ටාර්ගෙන් ලබාගත් උපැන්න සහතිකයක් එවිය යුතුයි.

4.2 ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක් එවිය යුතුය.

05. වාචික පරීක්ෂණය :

5.1 සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම :

ඉහත 1.1 වගන්තිය යටතේ දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී ආයුර්වේද මූලධර්ම, ද්‍රව්‍ය ගුණ විඥානය, රෝග විඥානය සහ චිකිත්සා විඥානය යන විෂයයන් පිළිබඳව ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇති දැයි පරීක්ෂා කරනු ලැබේ.

5.2 විශේෂ වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම :

ඉහත 2.1 වගන්තියේ සඳහන් සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේදී ආයුර්වේද මූලධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද, ඔවුන් ලියාපදිංචිවීමට බලාපොරොත්තු වන විශේෂ අංශය සම්බන්ධ ද්‍රව්‍ය ගුණ විඥානය, රෝග විඥානය සහ චිකිත්සා විඥානය යන විෂයයන් පිළිබඳ ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇතිදැයි පරීක්ෂා කරනු ලැබේ.

06. ලිඛිත හා වාචික පරීක්ෂණ :

6.1 සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම:

(අ) ඉහත 1.2 වගන්තිය යටතේ දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් සඳහා පළමුව කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී ආයුර්වේද මූලධර්ම, ද්‍රව්‍ය ගුණ විඥානය, රෝග විඥානය සහ චිකිත්සා විඥානය යන විෂයයන් පිළිබඳ ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇතිදැයි පරීක්ෂා කරනු ලැබේ.

(ආ) මෙම ලිඛිත පරීක්ෂණය ඉහත සඳහන් එක් විෂයකට ප්‍රශ්න පත්‍රයක් බැගින් ප්‍රශ්න පත්‍ර හතරකින් සමන්විත වේ.

(ඇ) සාමාන්‍යයෙන් අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍ර හතරෙන් ම එක්වර සමත් විය යුතුයි. එහෙත් එක්වර විෂයයන් තුනකින් පමණක් සමත් වන අයදුම්කරුවන්ට ඉතිරි විෂය පසුව සම්පූර්ණ කිරීමට අවසර දෙනු ලැබේ.

(ඈ) ඉහත දැක්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.මෙම පරීක්ෂණයේදී ඉහත සඳහන් විෂයයන් පිළිබඳව ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇතිදැයි වැඩිදුරටත් වාචිකව පරීක්ෂා කරනු ලැබේ.

6.2 විශේෂ වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීම:

(අ) ඉහත 2.2 වගන්තිය යටතේ දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් සඳහා පළමුව කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී ආයුර්වේද මූලධර්ම සහ අදාළ විශේෂ වෛද්‍ය අංශය සම්බන්ධ ද්‍රව්‍ය ගුණ විඥානය, රෝග විඥානය සහ චිකිත්සා විඥානය පිළිබඳව ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇති දැයි පරීක්ෂා කරනු ලැබේ.

DO NOT COPY

(ආ) මෙම පරීක්ෂණය : (i) ආයුර්වේද මූලධර්මය සහ
(ii) අදාළ විශේෂ අංශය

යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍ර දෙකින් ම එක්වර සමත්විය යුතුයි. එහෙත් අදාළ විශේෂ අංශය පමණක් සමත් වන අයදුම්කරුවන්ට ඉතිරි විෂය පසුව සම්පූර්ණ කිරීමට අවසර දෙනු ලැබේ.

(ඇ) ඉහත සඳහන් ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී ආයුර්වේද මූලධර්ම සහ තමන් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන විශේෂ අංශය සම්බන්ධ ද්‍රව්‍ය ගුණ විඥානය, රෝග විඥානය සහ චිකිත්සා විඥානය පිළිබඳ ඔවුනට ප්‍රමාණවත් දැනුමක් ඇතිදැයි වැඩිදුරටත් වාචිකව පරීක්ෂා කරනු ලැබේ.

07. පරීක්ෂණ පැවැත්වීම :

7.1 නියමිත සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරන අයදුම්කරුවනට ඉහත සඳහන් වාචික පරීක්ෂණ සහ ලිඛිත හා වාචික පරීක්ෂණ ආදිය සඳහා නියමිත ගාස්තු ගෙවිය යුතු අතර එම පරීක්ෂණ පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ආයුර්වේද වෛද්‍ය සභාව විසින් කල්වෙලා ඇතිව දැනුම් දෙනු ලැබේ.

7.2 අදාළ අයදුම්පත් ගාස්තුව සමග නියමිත පරිදි අයදුම්පත හා ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ සහ නියමිත පරිදි සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පරීක්ෂණ සඳහා සිටිය හැකි වාර ගණන :

8.1 සුදුසුකම් ඇති අයදුම්කරුවකුට යම් නියමිත ලිඛිත පරීක්ෂණයක් සඳහා තුන් වරකට නොවැඩි වාර ගණනක් පෙනී සිටිය හැකිය. එහෙත් විශේෂ හේතුන් මත පමණක් තවත් එක් වරක් පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා අවසර දීමට ආයුර්වේද වෛද්‍ය සභාවට හැකිය.

8.2 සුදුසුකම් ඇති අයදුම්කරුවෙකුට යම් නියමිත වාචික පරීක්ෂණයක් සඳහා තුන් වරකට නොවැඩි වාර ගණනක් පෙනී සිටිය හැකිය. එහෙත් විශේෂ හේතුන් මත පමණක් තවත් එක් වරක් පරීක්ෂණයකට පෙනී සිටීම සඳහා අවසර දීමට ආයුර්වේද වෛද්‍ය සභාවට හැකිය.

DO NOT COPY

09. ගාස්තු :

9.1 අයදුම්පත් ගාස්තු

ලියාපදිංචි වීම සඳහා අපේක්ෂිත අයදුම්කරුවන් අයදුම්පත සමග රු.1750/- ගාස්තුවක්ද ගෙවිය යුතුය.

9.2 පරීක්ෂණ ගාස්තු

ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ගාස්තු ගෙවිය යුතුය.

සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් සඳහා පැවැත්වෙන පරීක්ෂණ.

| | ලිඛිත පරීක්ෂණ ගාස්තු (රු.) | වාචික පරීක්ෂණ ගාස්තු (රු.) |
|---|---|---|
| පළමුවැනි වර | 3000/- | 2500/- |
| දෙවැනි වර | 3000/- | 2500/- |
| තෙවැනි වර | 3000/- | 2500/- |

විශේෂ වෛද්‍යවරුන් සඳහා පැවැත්වෙන පරීක්ෂණ :

| | ලිඛිත පරීක්ෂණ ගාස්තු (රු.) | වාචික පරීක්ෂණ ගාස්තු (රු.) |
|---|---|---|
| පළමුවැනි වර | 3000/- | 2500/- |
| දෙවැනි වර | 3000/- | 2500/- |
| තෙවැනි වර | 3000/- | 2500/- |

සටහන :

ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සමඟ පරීක්ෂණ ගාස්තු නොඑවිය යුතුයි. සුදුසුකම් ඇති අයදුම්කරුවනට එම ගාස්තු ගෙවන ලෙස පසුව දන්වා එවනු ඇත.

10. ලියාපදිංචි කිරීමේ ගාස්තු :

10.1 පනතේ 55 (1) (ඊ) වගන්තිය යටතේ සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා රු.7500/- ක ගාස්තුවක් ගෙවිය යුතු යි.

10.2 පනතේ 55 (2) වගන්තිය යටතේ විශේෂ වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා රු.5000/- ක ගාස්තුවක් ගෙවිය යුතු යි.

සටහන :

ලියාපදිංචි කිරීමේ ගාස්තු අයදුම්පත් සමඟ නොඑවිය යුතුයි. නියමිත පරීක්ෂණවලින් සමත් වන අයදුම්කරුවනට ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවන ලෙස පසුව දන්වනු ඇත.

DO NOT COPY

## II කොටස

සාමාන්‍ය (සර්වාංග) වෛද්‍යවරුන් සඳහා ලිඛිත පරීක්ෂණ සහ වාචික පරීක්ෂණ සඳහා විෂය නිර්දේශ (ආයුර්වේද අංශය) විෂය මාලාව

*ආයුර්වේද අංශය :*

මූලධර්ම

ත්‍රිධාතු, ත්‍රිදෝෂ, ත්‍රිමල සහ කායික විඥානය පිළිබඳ දැනීම එනම්, සප්ත ධාතු මල යන මොවුන්ගේ ලක්ෂණ, භේද පිහිටීම සහ මානව ශරීරය ක්‍රියා කරන අයුරු, ආම නිරාම ලක්ෂණ, ආගන්තුජ හා ස්ථානගත දෝෂ ලක්ෂණ සහ ස්වස්ථ ලක්ෂණ, රෝග වළක්වා ගැනීමේ ආයුර්වේද ක්‍රම සහ ශරීරයේ අස්ථි, සන්ධි, මාංශ පේෂි, ශිරා, ධමනි, ස්නායු, කණ්ඩරා, මර්ම, කලා, ත්වක්, හෘදය, මස්තිෂ්ක, ඕජස, අග්නි, පුප්ඵුස, වෘක්ක, ප්ලීහය, යකෘතය සහ ජනනේන්ද්‍රියන් ඇතුළුව, මහා ස්රෝතස් ආදි අවයවයන් පිහිටීම, ලක්ෂණ ක්‍රියා සහ ප්‍රයෝජන ගැන දැනීම අවශ්‍යමයි. තවද, පංච මහා භූත, ත්‍රිගුණ, පංචේන්ද්‍රිය ඉන්ද්‍රියාර්ථ, මනස යන මොවුන්ගේ සිද්ධාන්ත ගැනද, දින චර්‍යා විධි ඇතුළුව ව්‍යායාමය, විවේකය, නිද්‍රාව, වේග වැළැක්වීම, ආහාර පාන, වාතය, ආලෝකය යන මේවා රෝගාරෝග්‍ය සඳහා බලපාන අයුරු දැනගෙන සිටීම ප්‍රයෝජනවත් වේ.

ආයුර්වේද මූලධර්ම

කියැවිය යුතු පොත් -

- පදාර්ථ ව්‍යාඛ්‍යා සහිත චරක සංහිතාව ප්‍රථම භාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව හෝ චරක සිංහලානුවාදය, සූත්‍රස්ථානය (11 – 12 අධ්‍යාය දෙක), (13-15 අධ්‍යාය 3), විමානස්ථානය (38 අධ්‍යාය)
- ආයුර්වේද මූලධර්ම - වෛද්‍ය ඩී.ඇම්.ආර්.බී.දිසානායක
- සාරාර්ථ සංග්‍රහය - රජයේ මුද්‍රණය
- ත්‍රිදෝෂ තත්ව විවරණය - වෛද්‍ය ආර්යදාස කුමාරසිංහ
- පංච නිදානය - 2 වැනි මුද්‍රණය - වෛද්‍ය ඩී.එම්. ජයසිංහ

- ආයුර්වේදයේ ජීවන දර්ශනය - වෛද්‍ය අමරසිරි පොන්නම්පෙරුම
- ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණ විධි - වෛද්‍ය ආරියදාස කුමාරසිංහ
- සුශ්‍රැති සංහිතා ශරීරස්ථානය - කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර හිමි

වැඩිදුර කියැවීමට -

- සුශ්‍රැත සංහිතාව (සිංහල) සූත්‍රස්ථානය 14,15,21 අධ්‍යාය තුන
- අෂ්ටාංග හෘදය සංහිතාව (සිංහල)
- සූත්‍රස්ථානය (11,12,13 අධ්‍යාය තුන)
- ශරීරස්ථානය (1- 5 අධ්‍යාය පහ)
- ආයුර්වේද ව්‍යාකරණය

*ද්‍රව්‍ය විඥානය :*

ද්‍රව්‍යයන් හැඳිනීම, විභාගය, මාත්‍රා නියමය, ද්‍රව්‍ය සංස්කරණ විධි, ද්‍රව්‍යවල රස, ගුණ, වීර්ය, විපාක, ප්‍රභවාදීන්ගේ විස්තර, මාන ක්‍රම සහ ඖෂධ නිර්මාණ විධි ද ඇතුළුව ඖද්භිද පාර්ථිව ද්‍රව්‍යයන් සහ රස, මහා රස ආදීන් පිළිබඳ පර්යාය නාම ලක්ෂණ ප්‍රභේද, ගුණ ක්‍රියා සහ ශෝධන විධි ආදිය පිළිබඳ දැනීම, වමන, විරේචනාදි ද්‍රව්‍ය ගණයන්ට අයත් ද්‍රව්‍ය පිළිබඳවත්, අබිං, කංසා, ජයපාල, ගොඩකදුරු, වච්චනාවි, පල්මානික්කම් ආදී ඖෂධෝපයෝගී විෂ ද්‍රව්‍යයන් පිළිබඳ විශේෂ දැනීම.

ත්‍රිඵලා, ත්‍රිමද, චතුර්ජාත, පඩුෂණ, දශමූල, අෂ්ටවර්ග, ජීවණීය ගණ, ත්‍රිකටු, අෂ්ටලවණ, ගිතෙල්, තලතෙල්, මීපැණි, ක්ෂීර වර්ග, දධි, තක්‍ර සහ රෝගීන්ගේ ආහාර පාන සඳහා බහුල වශයෙන් යොදනු ලබන ද්‍රව්‍යයන්ගේ ගුණාගුණත් ඇතුළුව බටු, කටුවැල් බටු, ඉඟුරු, කොත්තමල්ලි, පත්පාඩගම්, දේවදාර, වදකහ, මුරුවා, කටුකරෝසන, ඉඟුරුපියලි, දියමිත්ත, රසකිඳ, ඉරිවේරිය, සැවැන්දරා, නෙළුම්, මානෙල්, කොහිල, සාරණ, වෙනිවැල්ගැට, වැල්පෙනල, සුදුලූණු, මුරුංගා, කොහොඹ, වැල්මදට, ඉරමුසු, උළුහාල්, සූදුරු,කළුදුරු, පෙරුම්කායම්, සහිඳලුනු, ලාක්ෂා, වැල්මී, භාතාවාරිය, දුම්මැල්ල, මුද්දරප්පලම්, පාවට්ටා, බැවිල, තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය, රත්නෙටුල්, රත්හඳුන්, සුදුහඳුන්, චීන්සහල්, ගොකටු, තිරස්සවාලු, එඬරු, අරත්ත, මදුරුතලා, නික, ලුනුවිල, ගොටුකොළ, කුකුරුමාන්, නුග, ඇහැටු, පංච වල්කල, සිරිතේක්කු, අසමෝදගම්, කොරාසානි, සතකුප්ප, කර්කටකශ්‍රිංගි, බුලත්, තලිස්පත්‍ර, කහඹිලියා, දැත්ත, අශෝක, රුක්අත්තන, කෝමාරිකා, කොතලහිඹුටු, රණවරා, නිරමුල්ලිය, අළුකෙසෙල්, හබරල, අමුක්කරා, කිරිබදු, උඳු, කොල්ලු, වෘද්ධදාරු සහ ගිරිතිල්ල, පෘෂ්ණපර්ණි සහ පොල්පලා, පුෂ්කරමූල සහ සුවඳ කොට්ටන්, ලෝධ්‍ර සහ ලොත් සුඹුලු, ඇහැළ, ඔළිඳ, වාල් මොළඟු, ගජතිප්පිලි, වළගසාල්, බටකිරිල්ල, කිරිඅගුණ, කුඩුම්රිස, කෙළිඳ සහ කිරිවැල්ල, මයිල සහ මලිත, නිදිකුම්බා, කරපිංචා, කුඹුරු, සාදික්ක, වී පොරි, බිංතල්, වදමල්, රත්මල්, කටුකරඬු, ප්‍රසාරනි, කතුරුපිල, මුඩමහණ, කීකිරිදිය, වේලා හා රන්මනිස්ස, වරා යන ද්‍රව්‍යයන්ගේ ප්‍රභේද, පර්යාය, ගුණාගුණ ඖෂධෝපයෝගි භාග පරිචය ආදීන් ගැන සහ සංයෝගයන්හිදී ගුණ වෙනස් වන අයුරුත් දැනීම අවශ්‍යයි.

DO NOT COPY

කියැවිය යුතු පොත් -

- ද්‍රව්‍ය මූලධර්ම - වෛද්‍ය එච්.අයි.චන්ද්‍රෙස්කර මහතා
- ආයුර්වේද ඖෂධ සංග්‍රහය - I, II, III කාණ්ඩ
- දිව ඔසු දිව බොජුන් - වෛද්‍ය ඩී. එම්. ජයසිංහ
-

වැඩිදුර කියැවීමට -

- භාව ප්‍රකාශය (සිංහලානුවාදය - නිඝණ්ඩු ඛණ්ඩය)
- රස ශාස්ත්‍රය - වෛද්‍ය ඩී.ඩී.උඩබේසේකර
- ද්‍රව්‍ය ගුණ විඥානය - පණ්ඩිත විලියම් අල්විස්
- දේශීය වෛද්‍ය ශබ්ද කෝෂය - කිරි ඇල්ලේ ඥානවිමල හිමි

*රෝග විඥානය :*

රෝග නිරුක්ති, රෝග ප්‍රභේද, රෝග මාර්ග, රෝග හේතු, සාමාන්‍ය විශේෂ භේදයන්, රෝගාරෝග්‍ය ස්වරූප, උපද්‍රවකර රෝග, විශේෂ සංක්‍රාමික රෝග, රෝග ආම ලක්ෂණ හා නිරාම ලක්ෂණ, සාධ්‍ය, යාප්‍ය, කෘච්ඡ්‍රසාධ්‍ය, අසාධ්‍ය සහ රෝගයන් පිළිබඳ දැනීම, නිදානාදි පංචකයන් පිළිබඳ විස්තරාත්මක දැනීම, රෝග සහ රෝගී පරීක්ෂා විධි යන මේ කරුණු ඇතුළුව ජ්වර, බාලක පක්ෂාඝාතය, සන්නි, කෝල, වලිප්පු, පිටගැස්ම සහ රක්තාතිසාර, ආමාතිසාර, පිත්තාතිසාර, ප්‍රවාහිකා, රක්තපිත්ත, කාශ, ශ්වාස, රාජයක්ෂමා, ආමාජීර්ණ රෝග, ග්‍රහණී පාණ්ඩු, ජර්දි, හෘදරෝග, අර්ශස්, ප්‍රමේහ, අශ්මරී ආදී මුත්‍ර ව්‍යුහාගත රෝග වෘද්ධි, උදර, ශෝථ, ගලගණ්ඩ, ගණ්ඩමාල, උපදංශ, පූයාමේහ, උන්මාද, භග්න, අපස්මාර, පක්ෂාඝාත, අර්දිතාදිවාත, රෝග ඇතුළුව, ඌර්ද්වාංග රෝග, මාන්දම්, ග්‍රහණී ආදී බාල රෝග, ගර්භණී රෝග, සූතිකා රෝග, ප්‍රදර ඇතුළු ස්ත්‍රී රෝග, ස්ථාවර ජංගම විෂ රෝග, ගෙඩි වණ, පිළිකා දි උණ රෝග යන මොවුන්ගේ හේතු සම්ප්‍රාප්ති, සාමාන්‍ය හා විශේෂ ලක්ෂණ, ඔවුනොවුන් වෙන් කර ගැනීමේ ක්‍රම, සාධ්‍යාසාධ්‍ය ලක්ෂණ සහ උපද්‍රවාදිය ගැන දැන ගැනීම අවශ්‍යය. තව ද මෙහි සඳහන් යම් කිසි රෝගයකට විශේෂ වෛද්‍යවරයන් ලෙස ලියාපදිංචිය අපේක්ෂා කරන්නවුන්ගෙන් ඒ ඒ රෝගයන් පිළිබඳව විස්තරාත්මක දැනීමක් අපේක්ෂා කැරේ.

කියවිය යුතු පොත් -

- මාධව නිදානය
- පංච නිදානය - 2 වෙන මුද්‍රණය - වෛද්‍ය ඩී.එම්. ජයසිංහ
- රෝග රෝගී පරීක්ෂා විධි - වෛද්‍ය එම්.එස්.පී. කුරේ විද්‍යාශේඛර
- සුශ්‍රැත සංහිතා

වැඩිදුර කියැවීමට -

- සිංහල යෝග රත්නාකරය
- භේසජ්ජ මංජුසාවේ උපයුක්ත භාග
- ව්‍යාධි විනිර්ණය - දොස්තර ආර්.බී. ලෙනෝරා
- චරක සංහිතාව - නිදාන හා චිකිත්සා ස්ථාන
- සුශ්‍රැත සංහිතා - සූත්‍රාස්ථානය
- අෂ්ටාංග හෘදය - නිදානස්ථානය

DO NOT COPY

*චිකිත්සා විඥානය :*

සාමාන්‍ය චිකිත්සා, විශේෂ චිකිත්සා, හේතු විපරිත, අර්ථකාරි, ඖෂධාදී චිකිත්සා භේද, පංචකර්ම විධි, ලංඝණ, වෘංහණ ක්‍රම ඇතුළුව, රෝග විඥානයේ සඳහන් සියලුම රෝගයන්ට සාමාන්‍ය මූලික චිකිත්සා විධි ආම නිරාම භේද හා දෝෂෝල්වන, දෝෂ හීනතාවයෙන් කරනු ලබන චිකිත්සා විධි, උපද්‍රව චිකිත්සා විධි සහ මෙරට බොහෝ සෙයින් ප්‍රසිද්ධ කසාය, අනුපාන, ගුලි, කල්ක, චූර්ණ ලේහ, රසායන, ඝෘත, තෛල, රසෞෂධ වර්ග සහ අරිෂ්ට ආසවයන් ගැන ද, ඒවා එක් එක් රෝගයන් විෂයෙහි යොදන අවස්ථා, මාත්‍රා අනුපාන සහ විශේෂ ගුණද, ආහාර විහරණාදි පථ්‍යාපථ්‍ය ක්‍රම ගැන ද දැනීම අවශ්‍ය යි.

කියැවිය යුතු පොත් -

- සාරසංක්ෂේපය
- සාරාර්ථ සංග්‍රහය
- පියූෂාර්ණවය - වෛද්‍ය ජේ.සී. කන්නන්ගර
- කෂාය සාගරය - වෛද්‍ය එස්. එස්. කොඩිකාර
- ආයුර්වේද චිකිත්සා මූලධර්ම - වෛද්‍ය අමරසිරි ජයතිලක

වැඩිදුර කියැවීමට :

- චක්‍රදත්තය (සිංහල)
- යෝගරත්නාකරය (සිංහල)

- වටිකා ප්‍රකරණය
- පංචකර්ම චිකිත්සා - වෛද්‍ය ගාමිණී විජේසිංහ
- අෂ්ටාංග හෘදය සංහිතාව
- චරක සංහිතාව
- සුශ්‍රැත සංහිතාව
- භෝජන සංග්‍රහය - පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි
- ලක්දිව රක්තරෝග සංග්‍රහය - පණ්ඩිත ජී .පී. වික්‍රමාරච්චි
- යෝගදාරණය

## III කොටස

විශේෂ වෛද්‍යවරුන් සඳහා ලිඛිත සහ වාචික පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය

(අ) සර්ප විෂ

(1). සර්ප විෂ වෙදකම පිළිබඳ මූලධර්ම :

ත්‍රිධාතු, ත්‍රිදෝෂ, ත්‍රිමල සහ කායික විඥානය පිළිබඳ දැනුම එනම්, සප්ත ධාතු මල යන මොවුන්ගේ ලක්ෂණ, භේද පිහිටීම සහ මානව ශරීරය ක්‍රියා කරන අයුරු, ආම නිරාම ලක්ෂණ, ආගන්තුජ හා ස්ථානගත දෝෂ ලක්ෂණ සහ ස්වස්ථ ලක්ෂණ, රෝග වළක්වා ගැනීමේ ආයුර්වේද ක්‍රම සහ ශරීරයේ අස්ථි, සන්ධි, මාංශ පේෂි, ශිරා, ධමනි, ස්නායු, කණ්ඩරා, මර්ම, කලා, ත්වක්, ආශය, හෘදය, මස්තිෂ්ක, ඕජය, අග්නි, පුප්ඵුස, වෘක්ක, ප්ලීහය, යකෘතය යන ඉන්ද්‍රියන් ඇතුළුව මහා ස්‍රෝතස ආදී අවයවයන්ගේ පිහිටීම, ලක්ෂණ ක්‍රියා සහ ප්‍රයෝජන පිළිබඳ දැනීම අවශ්‍ය යි. තවද, පංච මහා භූත, ත්‍රිගුණ, පංචේන්ද්‍රිය, ඉන්ද්‍රියාර්ථ, මනස යන මොවුන්ගේ සිද්ධාන්ත ගැනද දින චර්යාවිධි ඇතුළුව ව්‍යායාමය, විවේකය, නිද්‍රාව, වේග වැළැක්වීම, ආහාර පාන, වාතය, ආලෝකය යන මේවා රෝගාරෝග්‍ය සඳහා බලපාන අයුරු දැනගෙන සිටීම ප්‍රයෝජනවත් ය.

(2). සර්ප විෂ වෙදකම පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

ද්‍රව්‍ය හැඳිනීම, ප්‍රභේද, රස, ගුණ, වීර්ය, විපාක, ප්‍රභාව ආදීන්ගේ විස්තර පර්යාය නාම පිළිබඳ දැනුම. තිපල්, ත්‍රිකටු, ත්‍රිජාත, සුළුපස් මුල්, මහපස් මුල්, දසමුල්, පංචකෝල, පංචපාසානම්, පංචලවණ ආදී කොට ඇති සංයුක්ත ද්‍රව්‍යයන් පිළිබඳ දැනුම.

කොටකිඹුල, බෝ, නා, කපු, වරා,විෂකුම්භ, මදටිය, දිවිකඳුරු,වේලා, තඹ,තිලෝගුරු, නික, නුවරඑළියා, විදුලිතිලියා, හලඹකුමාරයා, මකුලේ යන්නා යන ද්‍රව්‍යයන් සඳහා යොදන සාමාන්‍ය නාම සහ එම ද්‍රව්‍යයන් විෂ වෙදකමේ යෙදෙන අවස්ථා ඉඟුරු, සුදුලූණු, දෙහි, ඇඹුල් දොඩම්, ගස්ලබු, පුපුලකොළ, බෝම්බු, බටදොඹ, කහ යන මේ ඖෂධ ප්‍රයෝජනයන් පිළිබඳ දැනුම. වච්චනාවි, පාසානම්, හිරියල්,පල්මානික්කම්, පුෂ්කර, ජයපාල ශෝධන මාරණ විධි, ඖෂධ මාත්‍රා සහ ප්‍රයෝග පිළිබඳ දැනුම ලබා තිබිය යුතු ය.

(3). සර්ප විෂ පිළිබඳ රෝග විඥානය :

විෂ සතුන් ගේ වර්ග, ඔවුන් හඳුනා ගැනීම සහ විවිධ වර්ග ඇතිවන ආකාරය, සර්ප විෂ හා ත්‍රිදෝෂ, විෂ ශරීරයේ ඉන්ද්‍රියන් කෙරෙහි බලපාන ආකාරය, සප්තධාතූන්හි පැතුරුණු ආකාරය සහ ලක්ෂණ පංච නිදාන පිළිබඳ දැනුම , විෂ වේග වළක්වා ගැනීම, ක්ෂණික ප්‍රතිකාර විධි යෙදීම, විෂ පිළිබඳ විවිධ මත. එනම්, දූත ලක්ෂණ, විෂ කලා, තිථි, දිනය, නැකත, ස්ථානය ආදී වශයෙන් දැක්වෙන කරුණු පිළිබඳ විශේෂ දැනුම. ඒ ඒ විෂ දෂ්ටයන්හිදී සාධ්‍යාසාධ්‍ය පිළිබඳව දැනීම ලබා තිබිය යුතුය.

(4). සර්ප විෂ පිළිබඳ චිකිත්සා විඥානය :

විෂට කළයුතු ප්‍රථමාධාර, විෂ ශරීරයෙහි පැතිරීම ක්ෂණිකව වළක්වා ගැනීමේ ක්‍රම, ප්‍රභේද අනුව චිකිත්සා යොදන ආකාරය, සප්ත විෂ වේගයන් අනුව ප්‍රතිකාර විධි යෙදීම. විෂ වෙදකම සඳහා යොදන කෂාය, ගුලි, කල්ක, චූර්ණ, තෛල හා ආලේප, ඝෘත, අරිෂ්ට, ආසව, මැල්ලුම, පත්තු සත්වයා අනුව විවිධ විෂ සඳහා විවිධ වශයෙන් ප්‍රතිකාර යොදන ආකාරය. විෂ වෙදකමේ යොදන විශේෂ

DO NOT COPY

අගද, පේයා, අංජන, කර්ණපූර්ණ, අක්ෂිපූර්ණ, පරිෂේක, අභ්‍යංග , නස්‍ය, වමන, විරේචන, වස්ති, රක්තමෝක්ෂණ විධි පිළිබඳ දැනුම විශේෂයි. පථ්‍යාපථ්‍ය විධි ආදී කරුණු පිළිබඳවද මනා දැනුමක් ලබා තිබිය යුතුයි.

කියැවිය යුතු පොත් -

- මාධව නිදානය (විෂ නිදානය)
- සාරාර්ථ සංග්‍රහය (විෂ චිකිත්සාව)

වැඩිදුර කියැවීම -

- චරක සංහිතාව (චිකිත්සා ස්ථානය - 23 අධ්‍යාය)
- සුශ්‍රැත හා කල්පස්ථානය
- අෂ්ටාංග හෘදය සංහිතාව උත්තු තන්ත්‍රය (35 – 28) අධ්‍යාය 4
- චක්‍රදත්තය (සිංහල)
- විෂ වෛද්‍ය චින්තාමණි 1,2,3 - වෛද්‍ය සිසිර කුමාර ලියනාරච්චි
- විෂ වෙද මුතුහර - වෛද්‍ය සිසිර කුමාර ලියනාරච්චි
- විෂ වෛද්‍ය විද්‍යාව - වෛද්‍ය කේ.ජී.පී. ජයතිලක
- ද්‍රව්‍ය ගුණ විඥානය - පණ්ඩිත විලියම් අල්විස්
- ආයුර්වේද ඖෂධ සංග්‍රහය - I, II, III කාණ්ඩ
- පංචකර්ම චිකිත්සා - වෛද්‍ය ගාමිණී විජේසිංහ
- ආයුර්වේද මූලධර්ම - වෛද්‍ය ඩී.එම්.ආර්.බී. දිසානායක
-

(ආ) ජලභීතිකා වෙදකම

(1). ජලභීතිකා වෙදකම පිළිබඳ මූලධර්ම :
(3 කොටස, සර්ප විෂ වෙදකම යටතේ දැක්වෙන මූලධර්ම සඳහා අදාලය)

(2). ජලභීතිකා වෙදකම පිළිබඳ ද්‍රව්‍යගුණ විඥානය :

ද්‍රව්‍ය හැඳිනීම, ප්‍රභේද, රස ගුණ වීර්ය විපාක ප්‍රභව ආදීන් පිළිබඳ දැනුම විශේෂ වශයෙන් අත්තන, කංසා, හොඩල, සීනුක්, පතොක්, අබිං, රසදිය, සාඳලිංගම්, මනෝසිල, තුත්තම්, යන ඖෂධ ආදී ශෝධන මාරණ විධි, මාත්‍රා හා ප්‍රයෝග විධි පිළිබඳ දැනුම.
රුක් අත්තන, කිරිඅඟුන, දිවුල්, දෙසඳුන්, සැවැන්දරා, ඉරමුසු, මුඟුණුවැන්න, ගොටුකොළ, දෙමට, ඉඟුරුපියලි, මදුරුතලා, කිතුල්, තණහාල්, හීනැටි හාල්, රසකිඳ, තිත්තකිඳ, වරා, මුරුංගා, කුප්මේනිය, හබරල, බක්මී, එළකටරොලු, කරවිල, තුඹකරවිල, කොහොඹ, නරමුත්‍ර, වෙනිවැල්ගැට, අමුක්කාර, වද කහ, පුස්වැල්, වසතැල්ල, දෙහි, ඇඹුල් දොඩම්, යකිනාරං, වියන්දුඹුලු, අමුකහ, බුරුල්ල, බුලත්, වැල්මී, තිපල්, ත්‍රිකටු, ත්‍රිවර්ග, ත්‍රිජාත, ත්‍රිසුගන්ධ, චතුර්ජාත, පංචගව්‍ය, පංචලවණ, ගිතෙල්, තලතෙල්, කොහොඹ තෙල් යන ඒකීය හා සංයුක්ත ද්‍රව්‍ය පිළිබඳ දැනුම ද අවශ්‍ය යි.

(3). ජලභීතිකා වෙදකම පිළිබඳ රෝග විඥානය :

රෝග පර්යාය, නාම, හැඳින්වීම, රෝග ප්‍රභේද, හේතු සම්ප්‍රාප්ති, ශරීර ව්‍යුහාව, පිස්සු වැටුණු සුනඛාදීන්ගේ ලක්ෂණ, පිස්සු බල්ලා දෂ්ට කිරීමට හේතු, පිස්සු බල්ලා දෂ්ට කළවිට පහළ වන ලක්ෂණ දින 3, 5, 7, 9 ආදී වශයෙන් පහළ වන ලක්ෂණ, සාධ්‍ය, අසාධ්‍ය, ලක්ෂණ, රෝගය වැළැඳෙන ආකාරය හා රෝගය වළක්වා ගන්නා ක්‍රම.

(4). ජලභීතිකා වෙදකම පිළිබඳ චිකිත්සා විඥානය :

දෂ්ට කළ කෙණෙහිම කළයුතු ප්‍රතිකාර, දෂ්ට කළ ස්ථානයට කළ යුතු ප්‍රතිකාර, අග්නිකර්ම, බන්ධණ, ප්‍රලේප, තෛල, ප්‍රයෝග විධි, රක්තමෝක්ෂණ විධි, නස්‍ය, වමන, විරේචන විධි යෙදීම, ස්නාන විධි හා ස්වේද විධි පිළිබඳ විශේෂ වශයෙන් දැනුම, පේයා, කැඳ වර්ග, වේදු ඇල්ලීම ආදී ක්‍රම පිළිබඳ දැනුම අවශ්‍ය යි. මහා විෂනිල තෛලය, මාධව කුලම්බුව, වරාල වර්තිකා ගුලිය වැනි

DO NOT COPY

ජලභීතිකා වෙදකමේ ප්‍රධාන වශයෙන් යෙදෙන ඖෂධ වර්ග පිළිබඳ දැනුම හා බලිතොවිල්කම් ආදී භූත විද්‍යාත්මක චිකිත්සා ක්‍රම පිළිබඳ දැනුම ද වැදගත්ය.

(ඇ) කැඩුම් බිඳුම් වෙදකම

(1). කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ මූලධර්ම :

(3 කොටස සර්ප විෂ වෙදකමේ දැක්වෙන මූලධර්ම මේ සඳහා අදාළය)

(2). කැඩුම් බිඳුම් පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

භග්න චිකිත්සාවට ගනු ලබන ද්‍රව්‍ය හැඳිනීම සහ ඒවායේ සංස්කරණ විධි එම ද්‍රව්‍ය ගුණ, මාංශ සන්ධාන, රක්ත ස්තම්භන, සන්ධි සන්ධාන, සන්ධි විශ්ලේෂණ, ඖෂධ වර්ග ඖද්භිද පාර්ථිව හා ජංගම ද්‍රව්‍යන්ගේ දේශීය හා ව්‍යවහාරික නාමයන්, පුෂ්කර, පල්මානිකම්, චීන අල, ගුග්ගුලු වැනි ද්‍රව්‍යයන්ගේ ශෝධන මාරණ විධි හා ඖෂධ සඳහා උපයෝගී කර ගන්නා අයුරු, මැල්ලුම්, පත්තු, ප්‍රලේප, පැලැස්තර, තැවිලි, පොට්ටනි, පාන ක්‍රම, තිකුළු, තිපල්, තිමද, ත්‍රිජාත, ත්‍රිසුගන්ධ, චතුර්ජාත, පංචකෝල, පංචමූල, පංචලවණ, දශමූල ආදී මිලිත ද්‍රව්‍යයන් පිළිබඳ දැනුම හා වෙනත් ව්‍යවහාරයේ එන දේශිය වට්ටෝරු පිළිබඳ දැනුම, පුවක්මල් ,පොල් මල්, වැටකේ, වැල්මදට, හීන්බෝවිටියා, අරත්ත, මදටිය, කැප්පෙටිය, අමුකහ, බැලතණ, තලතෙල්, ගිතෙල්, මීපැණි, පනම්පෙති, කැටකෑල, වල්ලා, ඇහැළ, ලුණුවරණ, දෙසඳුන්, දිවුල්, කුඹුක් ආදී දේශීය ව්‍යවහාරයේ එන ඖෂධ පිළිබඳ දැනීම.

(3). කැඩුම් බිඳුම් පිළිබඳ රෝග විඥානය :

භග්න හේතු, භග්න වර්ග, කාණ්ඩ භග්න, නාම හා ලක්ෂණ, විනිර්ණය නිර්ණය කිරීම, සන්ධි භග්න, නාම ලක්ෂණ නිර්ණය කිරීම, සරල භග්න හා සංකීර්ණ භග්නයේ විශේෂ උපද්‍රව, මධුමේහ වැනි උපද්‍රවකර රෝග ව්‍රණ විඥානය, නාඩි විඥානය, භග්න සාධ්‍යඅසාධ්‍ය ලක්ෂණ බන්ධන විධි හා ඒවා යෙදෙන අයුරු, කශේරුකා භග්න ලක්ෂණ, භග්නයකදී හට ගැනෙන ආක්ෂේප, ජ්වර, මූර්ජා හා මලමුත්‍රා බද්ධ හා ඒවාට හේතු, ශීර්ෂ භග්න උපද්‍රව හා මර්මස්ථාන පෙළීමේ ලක්ෂණ හා අභ්‍යන්තර ලේ ගැලීමක දී පහළ වන ලක්ෂණ හා ඒවා සිදුවන ස්ථාන පිළිබඳ දැනුම.

DO NOT COPY

(4). කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ චිකිත්සා විඥානය :

භග්න ප්‍රධාන චිකිත්සාවේ අවසන්ධි සන්ධි ගන්වන අයුරු හා කැඩී වෙන්වුණු අස්ථි කොටස් නියම අන්දමට තබන අයුරු දැන ගැනීම ප්‍රධාන අංගයක් සේ සැලකේ. විවිධ සන්ධි සන්ධාන ඖෂධ වර්ග වශයෙන් ගැනෙන ස්ථානිකව යෙදෙන ඒකීය ද්‍රව්‍ය සංස්කරණ හා බහු ද්‍රව්‍ය සංස්කරණ, මැල්ලුම්, පත්තු, තෛල වර්ග, අභ්‍යන්තර වශයෙන් යෙදෙන කෂාය හා චූර්ණ ගුටිකා, ලේහ වර්ග ද, විවිධ කාණ්ඩ භග්න සන්ධාන ඖෂධ වර්ග වශයෙන් ගැනෙන, ස්ථානිකව යෙදෙන, ඒකීය ද්‍රව්‍ය සංස්කරණ හා බහුද්‍රව්‍ය සංස්කරණ වන මැල්ලුම්, පත්තු, තෛල වර්ග, අරිෂ්ට, ආසව පිළිබඳ දැනුම, සංකීර්ණ භග්නයකට මූලික අවස්ථාවේ සිට අවසානය දක්වා යෙදෙන ප්‍රතිකාර විධි, එක් පැය හන්දිය, තුන්පැය හන්දිය, හත්පැය හන්දිය, තිස් පැය හන්දිය හා බත් ඉතිරෙන හන්දිය වශයෙන් දක්වා ඇති මැල්ලුම් පත්තු වර්ග, කාණ්ඩභග්න පිළියම්, සන්ධි ගැලවීමට යොදන පිළියම් ක්‍රම, ඔඩු වණ, ගෙඩි වණ සඳහා යොදන ඖෂධ වර්ග, රක්ත මෝක්ෂණ ක්‍රම හා රක්ත ස්තම්භන ක්‍රම, බන්ධන ද්‍රව්‍ය, බන්ධන වර්ග, ක්‍රම හා ඒවා ශරීරයේ විවිධ කොටස්වලට යොදන අයුරු, ජලමල අඩස්සියට යොදන ප්‍රතිකාර විධි, ශීර්ෂ භග්නයකදී යෙදෙන නස්‍ය විධි හා හිසට දමන වෙනත් ඖෂධ වර්ග, භග්න රෝගියෙකුට යොදන ආහාර විහරණ පථ්‍යාපථ්‍ය විධි පිළිබඳ දැනුම ද අවශ්‍ය යි.

කියැවිය යුතු පොත් :

- මාධව නිදානය (භග්න නිදානය)
- සාරාර්ථ සංග්‍රහය (භග්න නිදානය)
- ගෙඩි වණ වෙදකම පිළිබඳ ලියැවි ඇති වෙනත් පොත් සහ පුස්කොළ

- අත් වෙද පොත් පරිශීලනය කිරීම - කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ ලියැවී ඇති පොත් හා අත් වෙද පොත් පරිශීලනය කිරීම.

වැඩිදුර කියැවීම :

- යෝග රත්නාකරය (සිංහල)
- සුශ්‍රැත සංහිතාව (අදාළ කොටස්)
- දේශීය වෛද්‍ය ශබ්ද කෝෂය - කිරිඇල්ලේ ඥානවිමල හිමි
- අෂ්ටාංග හෘදය අදාළ කොටස්
- ආයුර්වේද රචනා ශරීර - වෛද්‍ය ජේ.ඩී.ඒ. කරුණාදාස
- ආයුර්වේද ව්‍යාකරණ
- ආයුර්වේද ඖෂධ සංග්‍රහය I, II, III

(ඈ) ගෙඩිවණ වෙදකම :

(1). ගෙඩිවණ වෙදකම පිළිබඳ මූලධර්ම :
(3 කොටස සර්ප විෂ වෙදකම යටතේ දැක්වෙන මූලධර්ම මේ සඳහා අදාළය)

(2). ගෙඩිවණ වෙදකම පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

ගෙඩිවණ වෙදකම පිළිබඳ චිකිත්සාවේ දී වනෞෂධ පිළිබඳ ප්‍රයෝජන ඉමහත්ය. එ බැවින් ඒ ද්‍රව්‍යයන් පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබිය යුතු යි.

ශොථහර, රක්තශෝධක, රක්ත ධාරක ඖෂධ පිළිබඳ දැනුම, දීපන, පාචන, ශමන ඖෂධ වර්ග හා ඒවායේ රස, ගුණ, වීර්ය, විපාක, ප්‍රභාව ආදීන් පිළිබඳ දැනුම, භේදන (විම්ලාපන) ගෙඩි පිපිරීම සඳහා යොදන ද්‍රව්‍යයන් පිළිබඳ දැනීම, විරේචන ද්‍රව්‍ය, වණ රෝපණ, වණ ශෝධන ද්‍රව්‍යයන් පිළිබඳ දැනුම හා පහත සඳහන් ද්‍රව්‍යන් පිළිබඳ හැඳිනීම ගුණකර්ම හා යොදන අවස්ථා පිළිබඳ දැනුම ලබා ගැනීම අවශ්‍ය යි. අංකෙන් ද, පනම්පෙති, අඟු, උඳුපියලි, මදට්ය, කැප්පෙටියා, වෙල්ලන්ගිරිය, මඟුල් කරඳ, කුණුකරඳ, ගොන්කැකිරි, රුක්අත්තන, නාපිරිත්ත, බේදුරු, හොඩල, වසතැල්ල, කයිල, සියඹලා, ගොරක, පඹුරු, අත්තන, ඔලිඳ, කුඩුම්රිස්ස, කාමරංගා, මූණමල්, තිබ්බටු, මුරුවා, තුඹ, බේත් අනෝදා, රත්තෙටුල්, කැහිපිත්තං, අට්ටික්කා, ගම්සූරිය, කැකුණ,ගැඩුඹ, යකිනාරං, තොට්ල, පෝටාවැල්, දැත්ත, තිරැස්ස, ඇට්ටමුරා, කුඹුරු, කුරුඳ, රත්තම්පලා, කුඩලු, රත්මල්, එරමිණියා, හාතාවාරිය, නික, ජයපාල, කැටකෑල, පෙනෙල, තිත්තවැටකොලු, නියඟලා, බක්මී, දිවුල්, නුග, වල්ලුණු, හරංකහ, කෝමාරිකා, කුකුරුමාන්.

රසදිය, සාදලිංගම්, හිරියල්, පාසානම්, ගෙන්දගම්, පල්මානිකම්, රිදීතුන්තන්, පුස්කර, මනෝසීල, වෙඩිලුණු, කැටලුණු, බළල් ලුණු යන ද්‍රව්‍යයන්ගේ ශෝධන මාරණ විධි හා මාත්‍රා නියමයන් ද, රස ගුණ, වීර්ය,විපාක ආදීන් පිළිබඳ දැනුම ද අවශ්‍ය යි.

DO NOT COPY

(3). ගෙඩිවණ වෙදකම පිළිබඳ රෝග විඥානය :

ගෙඩි යනු කීම, ගෙඩි සංඛ්‍යා, ගෙඩි හටගන්නා ස්ථාන, ගෙඩි ඇතිවීමට ත්‍රිවිධ හේතු, ශරීර දෝෂ කෝප, අභිඝාත, වැටීම, තැලීම්, පහර වැදීම් ආදී හා ස්ථාවර ජංගම ආදී වශයෙන් වන ඇටපලාගෙඩි, ඉලපලා ගෙඩි, පොකුරු විෂාද දී කණ්ඩ මාල, ගඩු, ඝෝර විෂාදි, රත ගෙඩි යන මේවායේ ලක්ෂණ සහ උපද්‍රව පිළිබඳ දැනුම.

ගෙඩියක ආම, පච්‍යමාන, පක්ව වශයෙන් වන අවස්ථා පිළිබඳ දැනුම ස්ත්‍රීන්ගේ පයෝධර වල ඇතිවන ගෙඩි හා ඒවායේ ඇතිවන ලක්ෂණ සහ උපද්‍රව පිළිබඳ දැනුම, චරක, සුශ්‍රැත, මාධව යන ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් අර්බුද විද්‍රධි, ප්‍රමේහ, පිඩකා, ගලගණ්ඩ, ගණ්ඩමාල, අපචි යන රෝගවල හේතු, පූර්ව රූප, රූප සහ සාධ්‍යාසාධ්‍යතාවන් පිළිබඳ දැනුම.

රතගාය හා රත ගෙඩි පිළිබඳ දැනුම ද ලබා තිබිය යුතු ය.

වණ යනු කීම? වණයක ලක්ෂණ , වණ ඇති විය හැකි ස්ථාන, වණ ප්‍රභේද පරංගි වණ, ඔඩු වණ, පණු වණ, අරමණ වණ, ලේ වණ යන මේවා හැඳිනීම මෙම වණ අවස්ථා වලදී ඇතිවන දෝෂ කෝප සහ ලක්ෂණ පිළිබඳ දැනුම ද, ආයුර්වේද ග්‍රන්ථ සංහිතාවල සඳහන්, ශුද්ධ වණ, දුෂ්ට වණ, රක්ත වණ, සාධ්‍ය වණ යන මේවායේ හේතු ලක්ෂණ පිළිබඳ දැනුම හා බාල තරුණ මහලු වශයෙන් ඇතිවිය හැකි රෝග පිළිබඳ දැනීම ලබා තිබිය යුතු යි.

(4). ගෙඩිවණ වෙදකම පිළිබඳ විඥානය :

මෙම චිකිත්සාව ඖෂධ සහ ශල්‍ය වශයෙන් දෙවැදෑරුම්ය. ශල්‍යකර්ම කටයුතු අවස්ථා සහ ගෙඩියකට ඖෂධ යොදන අවස්ථා පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.

ගෙඩි ඇන වීම (යටයාම) පත්තු, මැල්ලුම් සහ කෂාය, ගෙඩි පැසවීමට යොදන පත්තු, තැවිලි, කෂාය, ගෙඩි වල සැරව ඇද්දවීමට යොදන පත්තු, මැල්ලුම්, කෂාය, ගෙඩි ගැලවීම සඳහා යොදන ආලේපය හා කෂාය , ගෙඩි උඩට මතුවීමට ගාන පත්තු, කෂාය, ගෙඩි වල සැරව ඇද්දවීමට යොදන පත්තු, ආලේප, තැවිලි සහ කෂාය ගෙඩි උපද්‍රව වලට යොදන ගුලි, කල්ක කෂාය, චූර්ණ, අවලේහ වර්ග, ළමයින්ගේ රත ගෙඩිවලට ප්‍රතිකාර (මතුපිට ගාන බෙහෙත්) රත තෙල්, රතගෙඩි පිපිරීම සඳහා යොදන පත්තු, ආලේප ආදිය, ගෙඩි තැවීම සඳහා ඖෂධ පොට්ටනි සාදා ගැනීම සහ ඒවා තැවීම පිළිබඳ දැනුම භගන්දරා ගෙඩි වලට පත්තු කෂාය, ආලේප හා තැවිලි.

ගෙඩියක් පැලීමට සුදුසු අවස්ථාව හඳුනා ගැනීම, ගෙඩි නොපැලිය යුතු ස්ථාන පිළිබඳ දැනීම, පැලීමට ගන්නා උපකරණ පිළියෙල කර ගන්නා අයුරු, වේදනා නාශක ක්‍රම, ගෙඩියක් පැලූ පසු ඇතිවන උපද්‍රව්‍යවලට ප්‍රතිකාර ගෙඩි පැලූ පසු ඇතිවන උපද්‍රව පිළිබඳ දැනුම.

DO NOT COPY

*වණ චිකිත්සාව :*

වණ සුවවීමට යොදන පැලැස්තර හා වණ සේදීම සඳහා බෙහෙත් වතුර සාදා ගැනීම පිළිබඳ දැනුම, තුවාල (වණ) කුණ පෑදීමට යොදන පත්තු හා මැල්ලුම්, වණවල කොස්ස කැපීමට යොදන කාරම් බෙහෙත්, ඒවා යොදන ආකාරය, යෙදිය යුතු කාරම් වර්ග, යෙදූ පසු ඇතිවන උපද්‍රවවලට යොදන ප්‍රතිකාර, ඔඩුවණ, පණුවණ, අරමණ වණ මේවාට දුම් ඇල්ලීම, පත්තු, මැල්ලුම්, කෂාය ආදිය යෙදීමේ හැකියාව, ඔඩුවණ වල ඔඩු දිවීම නවත්තන පත්තු, ඔඩු තෙල් පිඹීම, ඔඩුවණ පැලීම පිළිබඳ දැනීම වණ රෝපණ තෙල් වර්ග හා යොදන අවස්ථා වණ උපද්‍රව වලට කෂාය, ගුලි, කල්ක වණ්ඩු බෙහෙත් යොදන අවස්ථා, පරංගි වණවල බඳින මැල්ලුම්, පත්තු, තෙල් හා බඩට දෙන බෙහෙත් කැඳ වර්ග නියපිරිත්තාවට ගාන බෙහෙත් සහ නියපොත්ත ගලවා දැමීමට කරන උපක්‍රම, රක්ත ශෝධන කෂාය, කැඳ වර්ග හා විරේක යෙදිය යුතු අවස්ථා පිළිබඳ දැනීම

*පිළිකා චිකිත්සාව:*

පිළිකාවලට ගාන බෙහෙත් හා කෂාය හා පිළිකාවලට පිලිස්සුම් චිකිත්සාව කරන ආකාරය හා වේදනා නාශක ක්‍රම පිළිකා සඳහා යොදන කෂාය, තෙල්, පත්තු, ආලේප ආදිය ගැන දැනීම, පිළිකාවට බෙහෙත් රොටි කෂාය පහත සඳහන් ඖෂධ යොදන අවස්ථා පිළිබඳ දැනුම.

1.රතතෙල් 2.යමදේව රාජ තෛලය 3.රත්තාදි තෛලය

4.ඔඩු තෙල් 5. අලබේත් චූර්ණය සහ ගෙඩිවණ චිකිත්සාවේදී යොදනු ලබන විශේෂ තෛල හා චූර්ණ වර්ග පිළිබඳ දැනුම, ගෙඩිවණ, පිළිකා රෝගීන් සඳහා පථ්‍යාපථ්‍ය විධි පිළිබඳ දැනුමද ලබා තිබිය යුතුයි.

කියවිය යුතු පොත් -

- මාධව නිදානය (අදාළ කොටස්)

- භෛෂජ්‍ය මංජුසා (අදාළ කොටස්)
- පංච නිධානය - දෙවැනි මුද්‍රණය - වෛද්‍ය ඩී.එම්.ජයසිංහ
- ගෙඩිවණ වෙදකම පිළිබඳ ලියවී ඇති වෙනත් පොත් සහ පුස්කොළ පොත් සහ අත් වෙද පොත් පරිශීලනය කිරීම.

වැඩි දුර කියවීමට -

- චරක සංහිතාව
- සුශ්‍රැත සංහිතාව
- වටිකා ප්‍රකරණය
- ද්‍රව්‍ය ගුණ විඥානය -පණ්ඩිත විලියම් අල්විස්
- ද්‍රව්‍ය විඥානය - වෛද්‍ය කේ.ජී.පී.ජයතිලක
- යෝග රත්නාකරය (සිංහල) - අදාළ කොටස්

(ඉ) දැවුම් පිළිස්සුම් වෙදකම

(1). දැවුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ මූලධර්ම :

(3 කොටසෙහි සර්ප විෂ යටතේ දැක්වෙන මූලධර්ම මේ සඳහා අදාළය)

(2). දැවුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

ද්‍රව්‍යන් හැඳිනීම, ද්‍රව්‍යන් සකස්කර ගන්නා විධි, ද්‍රව්‍යක රස, ගුණ, වීර්ය, විපාක, ප්‍රභාව ආදී විස්තර මාත්‍රා නියමය, මාන ක්‍රම, ඖෂධ නාම සහ ඒවා හඳුන්වන වෙනත් නම්, පංචවිධ, කෂාය,වන ස්වරස, ඵාණ්ඨ, හිම, කල්ක, කසාය සකස් කරගන්නා ක්‍රම තෙල් සංස්කරණ හා පාක විධි

ඖද්භිද, පාර්ථිව හා ජංගම ද්‍රව්‍යන් පිළිබඳ දැනුම, අබිං, කංසා, ජයපාල, ගොඩකදුරු, වච්චනාවි, පල්මාණික්කම් වැනි ඖෂධ පිළිබඳ විශේෂ දැනුම හා එවැනි ඖෂධ ශෝධන මාරණ විධි.

තිපල්, ත්‍රිකටු, චතුර්ජාත, පංචමූල, පංචලවණ, ෂඩූෂණ, අෂ්ට ලවණ, දශමූල ආදී සංයුක්ත ද්‍රව්‍යන් පිළිබඳ දැනුම ගිතෙල්, තල තෙල්, මී තෙල්, අබ තෙල්, කොහොඹ තෙල්, මී පැණි, ක්ෂීර වර්ග, දධි, තක්‍ර හා ආහාර ද්‍රව්‍ය පිළිබඳ දැනුම, කිරිඅඟුන, තිත්තඅඟුන, අමුකහ, ගෙඳ, කංසා, කළුදුරු, හරංකහ, කරඳ, මහවිරම්ණිය, පනම්පෙති, බුරුල්ල, වල්බෙලි, බෙහෙත්ගෙඳ, බෙල්ලන්, කෝමරිකා, කීන, මස්බැද්ද, කැපුම්කිරිය, අවරිය යන ද්‍රව්‍යන් පිළිබඳ විශේෂ දැනීම, ඒවායේ ප්‍රභේද, ඒවාට යොදන වෙනත් නම්, සංස්කරණයන්හිදී ගුණ වෙනස්වන අයුරු සහ දැවුම් පිළිස්සුම් ප්‍රතිකාරයේදී උපයෝගී කරගන්නා වෙනත් ඖෂධ පිළිබඳ විශේෂ දැනුමක් තිබිය යුතු යි.

(3). දැවුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ රෝග විඥානය :

නිධානාදි පංචකය, රෝග හා රෝගී පරීක්ෂා විධි දග්ධ හේතු, දග්ධ රෝගියාගේ හා රෝගයේ ස්භාවය, දග්ධ පරීක්ෂා, රුක්ෂ දග්ධ හා ද්‍රව දග්ධ පිළිබඳ විශේෂ දැනුම, රුක්ෂ දග්ධ ගින්නෙන් පිළිස්සීම, රත්වූ යකඩ, ගිනි අඟුරු, වෙඩි බෙහෙත් ආදියෙහි හා ද්‍රව දග්ධ, උණුදිය, උණු තෙල් රසායනික ද්‍රව්‍ය, ඇසිඩ් ද්‍රව්‍ය යන දෙයින් පිළිස්සීම ආදියේදී පවතින සාමාන්‍ය හා විශේෂ ලක්ෂණ .

උෂ්ණවාත, ආතප ආදියෙන් වන පිළිස්සීම් අකුණු සැර වැදීමෙන් වන පිළිස්සීම්, අදික සීතලෙන් වන පිළිස්සීම් වලදී පවතින ලක්ෂණ, දග්ධ ප්‍රභේද, එනම්, ත්වක්, මාංශ, ශිරා, ස්නායු, සන්ධි, අස්ථි දග්ධයන්හි දී සාමාන්‍ය හා විශේෂ ලක්ෂණ ද මේවා එකිනෙක වෙන්කර හැඳින්විය හැකි ක්‍රම, දග්ධ, සාධ්‍යාසාධ්‍ය, උපද්‍රව, පිළිබඳ විශේෂ දැනුම අපේක්ෂා කරේ.

(4). දැවුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ චිකිත්සා විඥානය :

දුෂ්ට ව්‍රණ සඳහා යෙදිය යුතු මූලික චිකිත්සා විධි, ලංඝන, බෘංහණ ක්‍රම, දග්ධ ව්‍රණ ශෝධන, රෝපණ ඖෂධ, ව්‍රණ බන්ධන හෙවත් වෙළුම් යෙදිය යුතු අවස්ථා සහ වෙළුම් නොබැඳීමෙන් වන හානි ,වෙළුම් නොයෙදිය යුතු අවස්ථා.

ද්‍රව දග්ධ හා වෘක්ෂ දග්ධ උපචාර විධි වෙන් වෙන් වශයෙන්ද, අග්නි දග්ධ පිළියම්, ක්ෂාර දග්ධ පිළියම්, පැට්‍රෝල්, භූමිතෙල් ආදියෙන් පිළිස්සීමේ දී යෙදිය යුතු චිකිත්සා, උණුදිය, උණුතෙල්, ඇසිඩ් වර්ග ආදියෙන් පිළිස්සීමේදී යෙදිය යුතු චිකිත්සා උෂ්ණවාත දග්ධ අකුණු සැර වැදීමෙන් වන පිළිස්සීම්, අධික සීතලෙන් පිළිස්සීමෙන් හා මෙහිදී කළයුතු චිකිත්සා.

DO NOT COPY

ක්ෂණික අවස්ථා අනුව යෙදිය යුතු පිලියම් හා දග්ධ ව්‍රණ උපද්‍රව,චිකිත්සා දග්ධ හේතුවෙන් වන ශාරීරික විකෘති ප්‍රතිකාර, දග්ධ චිකිත්සාවේදී හා උපද්‍රව කර රෝග අවස්ථාවේදී යොදන කෂාය, පත්තු, අනුපාන , ගුලි, කල්ක, චූර්ණ, ලේහ, රසායන, ඝෘත, තෛල, රස ඖෂධ හා අරිෂ්ඨ, ආසව ගුණද යෙදිය යුතු අවස්ථා මාත්‍රා, අනුපාන සහ ඒවායේ විශේෂ ගුණ අගුණ ආහාර විහරණාදි පථ්‍යාපථ්‍ය ක්‍රම ගැනද විශේෂ දැනුමක් තිබිය යුතු යි. තෛල වශයෙන් දග්ධ විෂනාශ, අග්නි විෂ ශාන්ති, ඔඩුතෙල යන මේවාත් දග්ධ ව්‍රණ චූර්ණ වැනි ඖෂධ පිළිබඳ දැනුම.

කියවිය යුතු පොත් -

- සාරසංක්ෂේපය
- අත්වෙද පොත්
- මාධව නිදානය - අදාළ කොටස්
- පංච නිදානය - 2 මුද්‍රණය - වෛද්‍ය ඩී.එම්.ජයසිංහ

වැඩිදුර කියැවීමට -

- සුශ්‍රැත සංහිතාව - අදාළ කොටස්
- චරක සංහිතාව - අදාළ කොටස්
- සිංහල චක්‍රදත්තය
- සිංහල යෝග රත්නාකරය
- වටිකා ප්‍රකරණය
- වෛද්‍ය චින්තාමණී භෛෂජ්‍ය සංග්‍රහය
- අග්නිකම් විධි - වෛද්‍ය පී.එම්.පී.අභයසිංහ
- ආයුර්වේද ව්‍යාකරණ
- භාවප්‍රකාශය

DO NOT COPY

(ඊ) විදුම් පිළිස්සුම් වෙදකම

(1). විදුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ මූලධර්ම :

ත්‍රිධාතු, සප්තධාතු, ත්‍රිමල, පංචමහා භූත, ප්‍රකෘති ලක්ෂණ හා ඒවායේ විකෘති ලක්ෂණ හා ක්‍රියා පිළිබඳ දැනුම, පංචේන්ද්‍රිය ඇතුළු, ඒවායේ අනෙකුත් ශරීරාංග පිළිබඳ සාමාන්‍ය දැනුම, අස්ථි, සන්ධි, මාංශපේශි, කණ්ඩරා, සිරා, ධමනි හා සම පිළිබඳ දැනුම ශරීරයේ මර්මස්ථාන නාම සංඛ්‍යා හා ඒවා පිහිටි ස්ථාන, ශරීරයේ මතුපිටින් ඒවා සලකුණු කිරීමට ඇති හැකියාව සහ මර්මස්ථාන පීඩා වූ ලක්ෂණ, විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමයේ භාවිත වන විවිධ යෙදුම් මැනුම් ක්‍රම පිළිබඳ ඥානය. විෂ කලා, අමෘත කලා, ස්ත්‍රී පුරුෂ භේදය අනුව ඒ ඒ දිනයන්හිදී පිහිටි ආකාරය ජ්‍යොතිෂයේ දැක්වෙන අයුරු විදුම් පිළිස්සුම් සඳහා භාවිතා කෙරෙන සුදුසු හා නුසුදුසු නැකැත් තිථි, කලා ආදිය පිළිබඳ දැනුම.

(2). විදුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

විදුම් පිළිස්සුම් සඳහා ගනු ලබන ගවදත්, එළු, වඳුරු ආදී විවිධ ද්‍රව්‍ය හඳුනා ගැනීම හා සකස් කර ගැනීම. විදුම් සඳහා ගන්නා විවිධ ලෝහ වර්ග සහ එම ලෝහ අනුසාරයෙන් විදුම් උපකරණ සකස් කර ගන්නා අන්දම සහ ඒවායේ ප්‍රමාණයන්, බොත්තම්, ගසන කටුව, අදිනා කටුව ආදී විවිධ දේශීය විදුම් පිළිස්සුම් උපකරණ සකස් කර ගන්නා අන්දම. විදීමෙන් පසු ඇතිවන අධික ලේ වහනය නතර කිරීමට ගන්නා ඖෂධ සහ ඒවා සකස් කර ගන්නා අන්දම, විදීමෙන් පසු ඇති වන තුවාලය සඳහා ඖෂධ වර්ග, පිළිස්සීමෙන් පසු එයට යොදන ඖෂධ වර්ග, සකස් කිරීමට උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය පිළිබඳ දැනුම.

(3). විදුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ රෝග විඥානය :

විදීමෙන් සුව කළ හැකි රෝග හඳුනා ගැනීම.

පිළිස්සීමෙන් සුව කළ හැකි රෝග හඳුනා ගැනීම.
ඉහත දැක්වූ ප්‍රතිකාර විධි දෙකට අවශ්‍ය වන රෝග හඳුනා ගැනීම.
සුව කළ හැකි හා සුව කළ නොහැකි රෝග වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම.
විවිධ සන්නි, ඉළප්පු ආදී දේශීය වෛද්‍ය නාමයෙන් භාවිත කෙරෙන රෝග පිළිබඳ ඥානය
රෝගයන් නිසා උපද්‍රවකර රෝග ලක්ෂණ හා ඒවායේ භේද දැන ගැනීම.

(4). විදුම් පිළිස්සුම් වෙදකම පිළිබඳ චිකිත්සා විඥානය :

විදුම් හෝ පිළිස්සුම් චිකිත්සා කර්මයේ දී අනුගමනය කළ යුතු පූර්ව කර්ම, ප්‍රධාන කර්ම හා පශ්චාත් කර්ම පිළිබඳ දැනීම.
විදුම් හා පිළිස්සුම් සඳහා සුදුසු, නුසුදුසු කාල පිළිබඳ දැනීම.
ත්‍රිදෝෂ ශමන විධි හා රක්ත ශමන විධි, වක්කං ඇල්ලීම.
විදුම් හා පිළිස්සුම් ප්‍රමාණයන් ගැන දැන ගැනීම.
විදීමෙන් පිළිස්සුම් ප්‍රමාණයන් ගැන දැන ගැනීම.
විදීමෙන් පිළිස්සීමෙන් පසුව කරන ප්‍රතිකාර විධි හා පථ්‍යාපථ්‍ය
විවිධ රෝග සඳහා විදින හා පුළුස්සන ස්ථානයන් වෙන් වෙන් වශයෙන් සවිස්තරව දැන ගැනීම.
විදීමෙන් හා පිළිස්සීමෙන් පසුව ඇතිවන උපද්‍රව කර රෝගයනට යොදන ප්‍රතිකාර විධි

(උ) ඇස් වෙදකම

(1). ඇස් වෙදකම පිළිබඳ මූලධර්ම :

(3 කොටස - සර්ප විෂයටතේ දැක්වෙන මූලධර්ම මේ සඳහා අදාළය.)

DO NOT COPY

(2). ඇස් වෙදකම පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

ද්‍රව්‍ය, ද්‍රව්‍ය ප්‍රභේද, ද්‍රව්‍යක අඩංගු රස, ගුණ, වීර්ය, විපාකාදීන් පිළිබඳ දැනුම, එනම් ගෙරිදත්, ගෙරිඅං,ඉත්තෑ කූරු,කැබැල්ලෑ පොතු, කොටි දත්, කිඹුල් දත්, වල් ඌරු දත්, නයි විෂ, උරුලෑ සට්ටම්, ගෙරි පිත, එළු පිත, මොණර පිත, බිත්තර කටු, කුකුල් පපුවේ තටු, බලු දිව, කටු, මිනී හිස් කබල්, හක්, ලූල් මාළු යන ද්‍රව්‍යය හැඳිනීම, ගුණ හා ඖෂධ ප්‍රයෝග කර ගන්නා අයුරු.

රසදිය, සාදලිංගම්, අංජන, මනෝසීල, සිවංගුරු, නියගලා, අබිං, ද්‍රව්‍ය ප්‍රභේද,, නාම පර්යාය, ශෝධන,මාරණ, ඖෂධ මාත්‍රා පිළිබඳ දැනුම ද, රා (විශේෂයෙන් පොල් රා) ත්‍රිඵලා, ත්‍රිකටු, ත්‍රිමද, ත්‍රිජාත, ත්‍රිවර්ග, චතුර්ජාත, දෙ කසා, ත්‍රිවෘත්,දුම්මැල්ල,දෙ සඳුන්, පීතකරෝසන, කෝමාරිකා, කොහොඹ, නික, වරා, කැබැල්ල, බෝමු, මී, ඇහැළ, රසකිඳ, කලාදුරු, ලුණුවිල, ගොටුකොළ, පුවක්මල්, පොල්මල්, පිච්චමල්, දෙළුම්මල්, සපුමල්, කිනිහිරියමල්, දෙහිමල්, ඉරමුසු, ගොඩකදුරු, තිත්ත තිබ්බටු, අස්වැන්න, පොල්පලා, කොහිල, කිරිබදු, දියමෙනේරි, උල්වැරණිය, මිදලු, මඟුල් කරඳ පිළිබඳ දැනීම

(3). ඇස් වෙදකම පිළිබඳ රෝග විඥානය :

ඇසේ නිර්මාණය හා ක්‍රියාකාරිත්වය, නේත්‍ර රෝග, සන්ධි රෝග පක්ෂ්ම රෝග ,වර්ත්ම රෝග, ශ්වේත මණ්ඩල රෝග, කෘෂ්ණ මණ්ඩල රෝග, පටල රෝග, භේද, හේතු, සම්ප්‍රාප්ති, රූප, උපද්‍රූවද ස්වතන්ත්‍ර හා පර තන්‍ත්‍ර නේත්‍ර රෝග, ඒවාහි වන උපද්‍රව පිළිබඳ දැන්ම.

(4). ඇස් රෝග පිළිබඳ චික්ත්සා විඥානය :

පංච විධ කෂාය, ගුලි, කල්ක, වර්තිකා, අරිෂ්ට, ආසව, අක්ෂි රෝගයන්හිදී යෙදීම හා මාත්‍රා නියමය.

තෛල අභ්‍යංග, ශිරෝධාර, අංජණ, දූමපාන, ආක්ෂෝපන, අක්ෂි තර්පන, ආලේප, නස්‍ය කර්ම පිළිබඳව සාමාන්‍ය වශයෙන් පංච කර්ම චිකිත්සාව පිළිබඳ දැනුමද, රසායන තර්පන පිළිබඳ දැනුමද ලබා තිබිය යුතු යි.

කියැවිය යුතු පොත් -

- මාධව නිදානය (අදාළ කොටස්)
- අක්ෂි රෝග - වෛද්‍ය ඒ.කේ.සෝමරත්න
- පංච කර්ම චිකිත්සා - වෛද්‍ය ගාමිණී තිලකරත්න
- චන්ද්‍ර මිහිරාව හෙවත් නේත්‍රා රෝග - පී.ජයසිංහ වෙදඅප්පුහාමි

වැඩිදුර කියවීමට -

- චරක සංහිතාව
- සුශ්‍රැත සංහිතාව
- අෂ්ටාංග හෘදය සංහිතාව
- සිංහල රෝග රත්නාකර

(ඌ) මානසික රෝග වෙදකම

(1). මානසික රෝග පිළිබඳ මූලධර්ම :
(3 කොටස - සර්ප විෂ යටතේ දැක්වෙන මූලධර්ම මේ සඳහා අදාළය.)

(2). මානසික රෝග පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

DO NOT COPY

ද්‍රව්‍යන් හැඳිනීම, ද්‍රවයන් සකස් කර ගන්නා අයුරු, ද්‍රව්‍යයක රස, ගුණ, වීර්ය, විපාක, ප්‍රභාවාදීන් පිළිබඳ දැනුම, මාත්‍රා නියමය, මානක්‍රම, ඖෂධනාම හා ඒවා හඳුන්වන වෙනත් නම්, පංචවිධ කෂාය, තෛල සකස් කර ගන්නා විධි, පාක විධි පිළිබඳ දැනුම.

බුද්ධිවර්ධක, මේධාකර, ස්මෘතිවර්ධක, ශෝධන, ශමන, සංග්‍රාහිත ද්‍රව්‍යයන් පිළිබඳ දැනුම විශේෂ යි. ගොටුකොළ, ලුණුවිල , කීකිරිදිය, සුවඳ කොට්ටන්, සුදුහඳුන්, සැවැන්දරා, ඉරිවේරිය, මානෙල්, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, දෙදුරු, සුදුලූණු, මුරුංගා, වෙනිවැල්, තුවරලා, කටුකරෝසන, වැල්මදට, පුහුල්, කෙසෙල්, කලාඳුරු, දියමිත්ත, අතිවිඩයන්, දෙබටු, ජටාමාංශ, දැත්ත, ඇහැළ, වැල්පෙනෙළ, මුකුණුවැන්න, තිපල්, අරත්ත, ඉරමුසු, දෙහි, බැබිල, නික යන ද්‍රව්‍යයන් පිළිබඳව ද පංචගව්‍ය, නස්‍ය ද්‍රව්‍ය, වමන ද්‍රව්‍ය, විරේචන ද්‍රව්‍ය, අනුවාසන ද්‍රව්‍ය, නිරූහන ද්‍රව්‍ය, පිළිබඳ දැනුම ද, තිපල්, තිකුළු, ත්‍රිජාත, චතුර්ජාත, ෂඩුෂණ, ත්‍රිසුගන්ධ වැනි සංයුක්ත ද්‍රව්‍යයන් පිළිබඳව ද දැනුමක් ලබාගත යුතු යි.

(3). මානසික රෝග පිළිබඳ ශරීර විඥානය :

ශරීර ක්‍රියා, මනස හෘදය හා එහි ක්‍රියා සම්බන්ධය, මනෝභූත, මනෝ ලක්ෂණ, ප්‍රකෘති විකෘති ස්වභාවයන් පිළිබඳ දැනුම පංචභූත, පංච ඉන්ද්‍රිය, ආත්ම, මනස හා ඇති සම්බන්ධතාව, මානසික රෝග යනු කවරේ ද? මානසික රෝග භේද, (පංචෝන්මාද) දේශීය වෙදකමේ දැක්වෙන උමතු භේද (විසි වැදෑරුම උමතු) හා රෝග හේතු

උන්මාද,අපස්මාර,සුතිකාඋන්මාද,රත්පිත්,භූතෝන් මාද, කෝල, සන්නි, දාහ, මූර්ජා, මද, සන්‍යාස, ආක්ෂේප, රෝග සහ වාතාදි රෝග භේද ලක්ෂණ සම්ප්‍රාප්තීන් පිළිබඳ සාධ්‍යාසාධ්‍යතාවන් පිළිබඳ දැනුම.

(4). මානසික රෝග පිළිබඳ චිකිත්සා විඥානය :

(i). අදෘෂ්ට භූත චිකිත්සා හෙවත් භූත වෛද්‍ය විද්‍යා උපක්‍රම පිළිබඳ දැනුම

(ii). විවිධ ආගම හා දර්ශනයන් අනුව මානසික දෝෂ පහකරන ක්‍රම
(විශේෂයෙන් බුද්ධ ධර්මය අනුව යෙදෙන භාවනා ක්‍රම එහි වටිනාකම පිළිබඳ අවබෝධය)

(iii). ද්‍රව්‍ය ගුණ චිකිත්සාව, කෂාය, ගුලි, කල්ක, තෛල ආදියෙන් කෙරෙන චිකිත්සාව ඒවා යොදන අවස්ථා හා යොදන ආකාරය පිළිබඳ දැනුම හා පෛත්තික ඝෘත, කල්‍යාණ ඝෘත, බ්‍රාහ්මී ඝෘත, වෙල්ලාරි ඝෘත, සරස්වතී ඝෘත යන ඝෘත පිළිබඳවත්, මහාවිකාර සන්නි තෛලය, සත්තවාදී තෛලය, චන්දනාදි තෛලය, රත්පිත් කේතකි තෛලය, විෂ්ණුරාජ තෛලය, කුමාරි තෛලය, බ්‍රාහ්මී තෛලය, නිල්‍යාදී තෛලය යන තෛල වර්ග විශේෂ වශයෙන් ප්‍රයෝග විසින් ද භූත භෛරව රස, උන්මාද ගජකේශරී රස, වාතකුලාන්තක රස, මහරද්විජය හා වෙනත් දේශීය වෙදකමේ යෙදෙන හස්තසාරඝෘත තෛල හා රසෞෂධ පිළිබඳ දැනුම.

(iv). විශේෂ වශයෙන් ශිරෝධාර, හිසකුඩිච්චි, ශිරොවස්ති, පිළිබඳ දැනුම නස්‍ය, වමන, විරේක, වස්ති, රක්තමෝක්ෂණ පිළිබඳ භේද යොදන කාල උපයෝගි කර ගන්නා ඖෂධ මාත්‍රා, පංචකර්ම යොදන ආකාරය, උපශයානුපශය, පථ්‍යාපථ්‍ය විධි පිළිබඳ ව විශේෂ ඥානයක් තිබිය යුතු යි.

කියැවිය යුතු පොත් -

- මාධව නිදානය - (අදාළ කොටස්)
- සාරසංෂේපය
- කෂාය සාගරය - වෛද්‍ය එස්.එස්.කොඩිකාර

වැඩිදුර කියැවීමට -

- චරක සංහිතාව
- සුශ්‍රැත සංහිතාව
- අෂ්ටාංග හෘද සංහිතාව
- පංචකර්ම චිකිත්සා - වෛද්‍ය ගාමිණී විජේසිංහ
- යෝග රත්නාකරය
- භාව ප්‍රකාශය

DO NOT COPY

(එ) චර්ම රෝග වෙදකම

(1). චර්ම රෝග පිළිබඳ මූලධර්ම :
(3 කොටස - සර්ප විෂ පිළිබඳ මූලධර්ම මේ සඳහා අදාළය.)

(2). චර්ම රෝග පිළිබඳ ද්‍රව්‍ය ගුණ විඥානය :

ද්‍රව්‍ය, ද්‍රව්‍ය ප්‍රභේද, ද්‍රව්‍යක අඩංගු රස, ගුණ, වීර්ය, විපාකාදීන් පිළිබඳ දැනුම, විශේෂ වශයෙන්, දුම්මැල්ල, කොහොඹ, රසකිඳ, පාවට්ටා, මඟුල්කරඳ, ඉරමුසු, චීන අල, රත්හඳුන්, වැල්මදට, හතාවාරිය, කටුකරෝසන ආදී වශයෙන් චර්ම රෝග සඳහා භාවිතා වන ද්‍රව්‍ය ඇත්තෝර, පෙතිතෝර, කරඳ, රත්කිහිරිය, මදටිය, ගංසූරිය, සෙමිකොට්ටන් (හල්ලාතක) වැනි ද්‍රව්‍යයන් ගේ ඖෂධොපයුක්ත කොටස් රස, ගුණ, වීර්ය, විපාකාදීන් පිළිබඳ දැනුම.

අෂ්ට වර්ග හා ප්‍රතිනිධි, තිපල්, තිකුළු, ත්‍රිජාත, ත්‍රිවර්ග, ත්‍රිමධුර, ත්‍රිසම, ත්‍රිසුගන්ධි, ත්‍රික්ෂාර, චතුර්ජාත, චතුරූෂණ, පංචාම්ල, පංචකෝල, පංච වල්කල, ෂඩූෂණ, අෂ්ට මූත්‍ර, අෂ්ට ලවණ, සුළුපස් මුල්, දශමූල් ආදී සංයුක්ත ද්‍රව්‍ය පිළිබඳ දැනුම.

අබිං, කංසා, ජයපාල ආදී ද්‍රව්‍යයන්ගේ ශෝධන, මාරණ විධි ඖෂධ මාත්‍රා

රසදිය, ගෙන්දගම්, පල්මානික්කම්, සාදලිංගම්, වච්චනාවි ආදී චර්ම රෝගවල දී විශේෂයෙන් යෙදෙන රස ඖෂධ ශෝධන පිළිබඳ දැනුම ශෝධන මාරණ විධි හා මාත්‍රා නියමයන් පිළිබඳ දැනුම

(3). චර්ම රෝග පිළිබඳ රෝග විඥානය :

පංචනිදාන පිළිබඳ දැනුම,චර්ම රෝග රෝගි පරීක්ෂණ,සම හා රක්ත රෝග පිළිබඳ දැනුම, චර්ම රෝග හේතු, සම්ප්‍රාප්ති, පූර්වරූප, රූප, උපශය පිළිබඳ දැනුම, චර්ම රෝග පිළිබඳ ප්‍රභේද හා ඒවා එකිනෙකට වෙන්කර ගන්නා අයුරු, චර්ම රෝග උපද්‍රව, සාධ්‍යාසාධ්‍යතාවයන් පිළිබඳ දැනුම.

(4). චර්ම රෝග පිළිබඳ චිකිත්සා විඥානය :

චර්ම රෝග සාමාන්‍ය චිකිත්සා විධි හා ඒ ඒ ප්‍රභේද අනුව විශේෂ චිකිත්සා විධි, එම රෝග සඳහා යොදන කෂාය, ගුලි, කල්ක, චූර්ණ, තෛල, අලේප, අරිෂ්ට කවරේ ද? චර්ම රෝගයන් විෂයෙහි යෙදෙන අවස්ථා, මාත්‍රා, අනුපාන හා විශේෂ ගුණාගුණ පිළිබඳ දැනුම, චර්ම රෝග විෂයෙහි පංචකර්ම විධි යෙදීම, පූර්වකර්ම, නස්‍ය, වමන, විරේක, වස්ති, රක්තමෝක්ෂණ විධි යෙදීම හා පථ්‍යාපථ්‍ය විධි යෙදීම පිළිබඳ දැනුම.

කියැවිය යුතු පොත් -

- මාධව නිදානය - කුෂ්ඨ,විසර්ප,අම්ලපිත්ත,ශීතපිත්ත,නිදාන
- කෂාය සාගරය - වෛද්‍ය එස්.එස්.කොඩිකාර
- පංච නිදාන 2 මුද්‍රණය - වෛද්‍ය ඩී.එම්.ජයසිංහ
- පංචකර්ම චිකිත්සා - වෛද්‍ය ගාමිණී විජේසිංහ
- චර්ම රෝග නිදාන හා චිකිත්සාව - වෛද්‍ය ඩී.එම්.ජයසිංහ

වැඩිදුර කියැවීමට -

දේශීය වෛද්‍ය ශබ්ද කෝෂය - කිරිඇල්ලේ ඥානවිමල හිමි

- ව්‍යාධි විනිර්ණය - දොස්තර ආර්.බී.ලෙනෝරා
- චරක සංහිතාව
- සිංහල යෝග රත්නාකරය
- සුශ්‍රැත සංහිතාව
- අෂ්ටාංග හෘදය සංහිතාව
- සිංහල කෂාය සංග්‍රහය
- කෂාය සාගරය - වෛද්‍ය එස්.එස්.කොඩිකාර
- ලක්දිව රක්ත රෝග සංග්‍රහය - පණ්ඩිත ජී.ජී.වික්‍රමාරච්චි

DO NOT COPY

ලේඛකාධිකාරි
ආයුර්වේද වෛද්‍ය සභාව

2018.10.23